ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය
(නාරා ආයතනය)
<u>තනතුරු පුරප්පාඩු</u>

ධීවර,ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (නාරා ආයතනය) ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් පිළිබඳ විෂය සම්බන්ධයෙන් පර්යේෂණ සංවර්ධන හා කළමනාකරණ කටයුතු සිදුකරන හා සම්බන්ධීකරණය කිරීමේ වගකීම භාර ප්‍රධාන ජාතික ආයතනය වේ.
නාරා ආයතනයේ පහත සඳහන් පුරප්පාඩු වූ තනතුරු සඳහා අදාල සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයින්ට අවස්ථාව විවර වේ.

01 අධ්‍යක්ෂ ජනරාල් (තනතුරු 01)

<u>බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්</u>

01 විද්‍යාව/කෘෂිකර්මය/ව්‍යාපාර පරිපාලනය/රාජ්‍ය පරිපාලනය/වානිජ්‍ය හෝ වෙනත් අදාල විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සමග

ඉහත විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක්(Postgraduate Degree) ලබා තිබීම හෝ කළමනාකරණය පිළිබඳව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක , ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 18 ක පළපුරුද්ද (අවම වශයෙන් මින් වසර 05 ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.)

හෝ

02 විද්‍යාව/කෘෂිකර්මය/ව්‍යාපාර පරිපාලනය/රාජ්‍ය පරිපාලනය/වානිජ්‍ය හෝ වෙනත් අදාල විෂය ක්ෂෙත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියක් ලබා තිබීම.

සමඟ

ඉහත විෂය ක්ෂේත්‍රයකින් හෝ වෙනත් අදාල විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

සහ

ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක,ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 05 ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියකු වශයෙන් පළපුරුද්ද ලබා තිබීම.
වයස - බාහිර අයදුම්කරුවන් සඳහා වයස අවුරුදු 35 ට නො අඩු හා අවු.55 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය.
සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය
HM 2-3 - 1/2025: රු. 173,000 – 12 x රු.4850 = රු.231,200/-

(2027.01.01 දින තෙක් සිදු කෙරෙන බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා වැටුප් ගෙවීම් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 හි II උපලේඛනය පරිදි සිදු කරනු ලබයි.)

වෙනත් දීමනා :- මෙම සේවා බාණ්ඩයට හිමි,රජය විසින් අනුමත අදාල වෙනත් දීමනා ද ගෙවනු ලැබේ.

02. **අධ්‍යක්ෂ පාලන හා මානව සම්පත් (තනතුරු 01)**

අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය පරිපාලනය/ වාණිජ්‍ය හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

සමඟ

අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Postgraduate Degree) ලබා තිබීම හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක"කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාල විෂය ක්ෂේත්‍රයේ වසර දහතුන (13) ක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් ක්‍රමය:

HM 1-3 - රු. 152,500– 15 × රු.4,100 – රු.214,000

(2027.01.01 දින තෙක් සිදු කෙරෙන බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා වැටුප් ගෙවීම් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 හි II උපලේඛනය පරිදි සිදු කරනු ලබයි.)

වෙනත් දීමනා :- මෙම සේවා බාණ්ඩයට හිමි,රජය විසින් අනුමත අදාල වෙනත් දීමනා ද ගෙවනු ලැබේ.

වයස :අවු 35 ට නොඅඩු සහ හා අවු 55 ට නොවැඩි විය යුතුය.

පත්වීමේ ස්වභාවය :- මෙම තනතුරු ද්විත්වයම ස්ථිර,සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

පොදු කරුණු :

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

i ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

අයදුම්කරන පිළිවෙළ

සියළුම අයදුම්කරුවන් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග ඔබගේ සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව, මූලික අධ්‍යාපන,වෘත්තීය සුදුසුකම් හා සේවක පළපුරුද්ද සනාථකරන සහතික වල පිටපත් සහ උප්පැන්න සහතිකයේ පිටපතක් ද සමඟ **2026 නොවැම්බර් 10** වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **අධ්‍යක්ෂ ජනරාල්,ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය, කාක දූපත,මට්ටක්කුලිය, කොළඹ 15** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය.අයදුම් කරන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයන්හි දී ලකුණු ලබාදීම පහත පරිදිවේ.

අදාල අතිරේක පළපුරුද්ද සඳහා	ලකුණු	30
අදාළ අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සඳහා	ලකුණු	30
අනෙකුත් කාර්යය සාධනයන් හා කුසලතා සඳහා	ලකුණු	15
සම්මුඛ පරීක්ෂණයේදී කාර්ය සාධනය	ලකුණු	25
මුළු ලකුණු ගණන		100

රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩල,සංස්ථා හෝ දෙපාර්තමේන්තුවල ඉල්ලුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතු අතර, ආයතන ප්‍රධානීන් මඟින් එවනු නොලබන, ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හා අපැහැදිලි අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත,
මට්ටක්කුලිය,කොළඹ - 15
011 – 2521000 / 2521006
(www.nara.ac.lk)